# යක්ෂ අර්ධ වෛදික ගැටුම

සිංහලයන් පැවත එන්නේ විජය රජු හා ඔහු සමග පැමිණි හත්සියයෙන් ය යන්න පිළිගැනීමට නො හැකි ය. පස්වැනි සියවස වන විට සිංහලයන්ගේ සම්භවය පිළිබඳ එවැනි ජනප්‍රවාදයක් නිර්මාණය වී තිබෙන්නට ඇත. එකල ලියැවුණු ග්‍රන්ථවල ද ඇතුළත් වේ මේ ප්‍රවාදය මහාවංසයෙහි ද සඳහන්කෙරී ඇත. අප මෙය තේරුම් ගන්නේ කෙසේ ද? මහාවංස කතෘ මහානාම හිමියන් මත සියළු වරද පටවා උන්වහන්සේට දක්ෂිණ භාරතීය ජන්මයක් ලබා දී උන්වහන්සේ සිංහලයන්ගේ සම්භවය ඉන්දියාවට යටකෙළේ යැයි කීම ප්‍රශ්නයට පිළිතුරක් නො වෙයි.

මහානාම හිමියන්ගේ දකුණු ඉන්දීය සම්භවයක් ගැන කිසිම වූ ආකාරයක තොරතුරක් වංසකතාවලින් හෝ වෙනත් ග්‍රන්ථයකින් හෝ සෙල්ලිපියකින් හෝ කියැවෙන බවක් දැනගන්නට නැත. උන්වහන්සේ ගිහියකු වශයෙන් ධාතුසේන රජුගේ මාමා යැයි සඳහන්වෙයි. ධාතුසේන කුමරා රැකබලාගෙන රජකමට පුහුණුකෙළේ ද මහානාම හිමියන් බවට මතයක් ඇත. මහාවංසය යනු සිංහල බෞද්ධ රාජ්‍යය තහවුරුකිරීම සඳහා ලියැවුණු ප්‍රවාද රැගත් කෘතියක් යැයි අපි කීවෙමු. බොහෝවිට ඒ ග්‍රන්ථය ධාතුසේන කුමරාගේ අධ්‍යාපනය සඳහා ද යොදාගන්නට ඇත.

ඕනෑම ඉතිහාස ග්‍රන්ථයක් අනෙක් දැනුම් මෙන් ම සාපේක්ෂ වෙයි. ඉතිහාස ග්‍රන්ථයක් ඇතුළු දැනුම නිර්මාණය වන්නේ ඒ නිර්මාණය වන සමාජයට සාපේක්ෂව ය. ඊනියා වාස්තවික ග්‍රන්ථ හා දැනුම ඇත්තේ වාස්තවිකවාදීන් යැයි කියාගන්නවුන්ගේ මනසෙහි පමණ ය. අප මේ ලියන දෑ ද මේ කාලයට සාපේක්ෂ ය. මෙකල පවතින සමාජ තත්වය නොවන්නට මේ ලිපි නොලියැවෙනු ඇත. සමාජයට සාපේක්ෂව ලියන ලිපියක් හෝ ග්‍රන්ථයක් හෝ නිර්මාණය වන ප්‍රවාදයක් හෝ යම්කිසි චින්තනයක් මත පදනම් වෙයි. මෙරට උගතුන් යැයි කියන්නවුන්ගෙන් ඉතා විශාල බහුතරය දැනුමක් නිර්මාණය නොකළ ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි පුහුණුව ලැබුවෝ වෙති.

මහානාම හිමියන් දවස ඇති වූ ප්‍රවාද මෙන් ම ජනපුවාද ද මගින් එකල පැවති සමාජ තත්වය ගැන යම් අවබෝධයක් ලබාගත හැකි ය. අප මෙයින් යම් කරුණු කලින් කියා ඇති නමුත් ඒ නැවත මතක්කර ගැනීම අවශ්‍ය වෙයි. දකුණු භාරතයේ සොළී බලය වර්ධනය වීම ඇරඹී ඇත්තේ මෙකල ය. දෙමළ සත් රජවරුන් ලංකාව ආක්‍රමණයකර ඇත්තේ ද මෙකල ය. සොළින්ගේ රටට උඩින් පිහිටි ආන්ද්‍ර ප්‍රදේශයෙහි ථෙරවාදය නැති වී යැමේ තර්ජනයට මුහුණ පා ඇත්තේ ද මෙකල ය.

සිංහලයට ඉතාමත් දැඩි තර්ජනයක් දකුණු භාරතයෙන් එල්ල වූ එකල සිංහලකමත් බෞද්ධකමත් දෙකම රැකගැනීම සිංහල රජවරුන්ට විශාල අභියෝගයක් විය. ඒ අභියෝගය යම් පමණකින් හෝ ජයග්‍රහණය කරනු ලැබුයේ ධාතුසේන රජු විසිනි. එතෙක් සිංහල ඉතිහාසය මේ අභියෝගය ජයගන්නේ කෙසේ ද යන්නට පිළිතුරක් ලෙස අර්ථකථනය කෙරුණේ මේ යුගයෙහි දී ය. අභියෝගය දෙපැත්තකින් එල්ල විය. එක් පැත්තකින් ඒ කෙළින් ම සිංහල රාජ්‍යයට එරෙහිව සොළීන්ගෙන් එල්ලවුණු අභියෝගයක් විය. අනෙක් පැත්තෙන් එය ථෙරවාදයට එල්ල වූ අභියෝගයක් විය.

ථෙරවාදයට දෙයාකාරයකින් තර්ජනය එල්ල විය. එක් පැත්තකින් සොළින්ගේ වෛදික තර්ජනය විය. අනෙක් පැත්තෙන් ආන්ද්‍ර දේශයේ මෙන් මාධ්‍යමික තර්ජනයකට හා ඒ ආශ්‍රිත මහායාන බලපෑම්වලට මුහුණදීමට ථෙරවාදයට සිදුවීය. බුදුදහම ආරක්ෂාකිරීම පිළිබඳ දැඩි සංකල්පයක් සිංහල සංස්කෘතියට එක්වුයේ එකල බව පැහැදිලි ය. මහායානයට යටවන බුදුදහමකට ඉන්දීය කලාපයක පැවැත්මනක් නැත. මහායානික බෝධිසත්ව ආදී සංකල්ප අවසානයේ දී දෙවියන් පිළිබඳ සංකල්ප බවට පත්වීමත් සමස්ත මහායානය ම වේදාන්ත දර්ශනයට යටවීමත් එකල පැවති අත්දැකීම විය.

මේ හේතුවෙන් එකල පැවති සමාජයට සාපේක්ෂව ඉන් ඉහත සිංහල රාජ්‍යයට වූ ආක්‍රමණ සොළී දෙමළ ආදී වශයෙන් නම්කෙරී ඇත. සේන ගුත්තික හා එළාර ගැන අද පවා සොළින් හෝ දෙමළ හෝ වශයෙන් සිතීමට සිංහලයන් පෙළඹෙන්නේ මේ නම්කිරීම හේතුකොට ගෙන ය. එසේ නම්කිරීම සිංහලයන්ට අවාසි වුවත් අවුරුදු එක්දහස් පන්සියයකට වැඩි ඉතිහාසයක විඥානයක් ලෙහෙසියෙන් ඉවත්කළ හැකි නො වෙයි. එළාර රජු බොහෝවිට

© Prof. Nalin De Silva

පර්සියාවෙන්, එනම් අඩුවැඩි වශයෙන් ගත්කල වත්මන් ඉරානයෙන්, පැමිණි අයකු යැයි කියැවෙයි. එළාර රජු ගැන ඇති ඇතැම් ජනප්‍රවාද පර්සියාවේ රජවරුන් සම්බන්ධයෙන් ද කියැවෙයි.

පර්සියාවේ රජවරුන් ද එකල තම යහන්ගැබේ ඝන්ඨාරයක් සවිකර ඇත. එමගින් රාත්‍රියෙහි වුව ද ඕනෑම අයකුට අවශ්‍යතාවක් ඇත්නම් රජුට පැමිණිලිකිරීමට හැකි විය. මෙවැනි චාරිත්‍රයක් දක්ෂිණ භාරතයේ රජවරුන් අතර තිබී නැත. එළාර රජුගේ ධාර්මිකත්වය (එනම් රාජ ධර්ම) සැසඳිය හැක්කේ පර්සියන් රජවරුන් සමග මිස දක්ෂිණ භාරතයේ රජවරුන් සමග නො වෙයි. එහෙත් පස්වැනි සියවසේ පමණ ලංකාවේ පැවති අවශ්‍යතා අනුව එළාර සොළී රජ කෙනකු කිරීම පුදුමයක් නො වෙයි.

ඇතැමුන්ට අනුව යක්ෂ ගෝත්‍රිකයන් දඹදිවට හා ලංකාවට පැමිණ ඇත්තේ පර්සියාවෙන් ය. මෙය අපට පහසුවෙන් ඉවත දැමිය හැකි කරුණක් නො වේ. වෛදිකයන් ද, එනම් ආර්යයන් යනුවෙන් හැඳින්වෙන්නන් ද දඹදිවට පැමිණ ඇත්තේ පර්සියාවෙන් ය. යක්ෂයන් වෛදිකයන්ට බොහෝ කලකට පෙර දඹදිවට හා ලංකාවට පැමිණි ගෝත්‍රිකයන් යැයි විශ්වාස කළ හැකි ය. ඇතැම්විට එළාර රජුට ද යම්කිසි යක්ෂ සම්භවයක් තිබිණි දැයි අපි නො දනිමු. එහෙත් එසේ තිබිණි යැයි උපකල්පනයකිරීමෙන් අපට ඉතිහාසයේ ඇතැම් දෑ පිළිබඳව දැනට වඩා සංගත චිත්‍රයක් ඇතිකර ගත හැකි ය.

පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය ඇතිවිණි යැයි අපි කියමු. එහි දී යක්ෂ, නාග, දේව ආදී ගෝත්‍ර මෙන් ම එ දවසට අවුරුදු පන්සියයකට පමණ පෙර දඹදිවින් ලංකාවට පැමිණි අර්ධ වෛදිකයන් ද එක් වී සිංහල ජාතිය නිර්මාණය කර ඇත. (යක්ෂ ගෝත්‍රය අර්ධ වෛදිකයන්ට අවුරුදු සිය ගණනකට පෙර ලංකාවට පැමිනෙන්නට ඇත.) සිංහල ජාතිය ඇතිවිණි ද ඒ ඒ ගෝත්‍ර අතර තිබූ සියළු වෙනස්කම් හා භේද නැතිවිණි යැයි මෙයින් නො කියවෙයි. විශේෂයෙන් ම යක්ෂ ගෝත්‍රිකයන් තම අනන්‍යතාව රැකගැනීමට උත්සාහ දරා ඇති බව පැහැදිලි ය. අදින් වසර පනහකට පමණ පෙර ද, මින්නේරිය අවට ප්‍රදේශයේ අනෙක් සිංහලයන්ගෙන් විශේෂිත වූ අනන්‍යතාවක් සහිත යක්ෂ ගෝත්‍රයට සම්බන්ධ පිරිස් ජීවත්ව ඇති බව පැහැදිලි ය.

සිංහලයන් අතර ප්‍රධානත්වය, එනම් දේශපාලන හා සංස්කෘතික නායකත්වය සඳහා අර්ධ වෛදිකයන් හා යක්ෂයන් අතර අවුරුදු දහසක පමණ කාලයක් මුළුල්ලෙහි තරගයක් පැවතී ඇත. ඒ තරගය ගැන තොරතුරු මහාවංසයෙන් ද හෙළිවෙයි. මහාසෝන සෙනෙවියා පිළිබඳ කතාවෙන් මෙන් ම මින්නේරියේ මහසෙන් රජුගේ කතාවේ ද මේ තරගය ගැන කියැවෙයි. සිංහලයේ ඉතිහාසය මේ ගැටුමෙහි දෘෂ්ටි කෝණයෙන් බැලීමෙන් අපට ඉතිහාසය වඩාත් සංගත ආකාරයකින් ලිවිය හැකි යැයි සිතමි.

පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය ඇතිවීම හා මහාවංසය ලිවීම අතර කාලපරිච්ඡේදයෙහි දේශපාලන නායකත්වය මෙන් ම සංස්කෘතික නායකත්වය ද අර්ධ වෛදිකයන්ට හිමි වී තිබේ. බොහෝවිට සිදුවන්නට ඇත්තේ අර්ධ වෛදිකයන් පළමුව සංස්කෘතික නායකත්වය ගැනීම ය. යක්ෂයන්ට මෙන් නොව අර්ධ වෛදිකයන්ට බෞද්ධ වීම එතරම් ගැටළුවක් නොවූ බව පැහැදිලි ය. බුදු දහම නිර්මාණය වී ඇත්තේ ම අර්ධ වෛදික සංස්කෘතියක බැවින් අර්ධ වෛදිකයෝ අපහසුවක් නැතිව බුදු දහම වැළඳගත්තෝ ය. එහෙත් යක්ෂයෝ එසේ නො වූහ.

යක්ෂයන් හා වෛදිකයන් අතර පැහැදිලි වෙනසක් වෙයි. ඔවුන් දෙකොටස ම පර්සියාවෙන් දඹදිවට පැමිණිය ද, එහි දී ඔවුන් ක්‍රියාකර ඇත්තේ දෙයාකාරයකට ය. යක්ෂයන් වඩා උනන්දු වී ඇත්තේ තම සංස්කෘතිය හා අනන්‍යතාව රැකගෙන ජීවත්වීමට ය. ඒ එක්තරා ආකාරයකට යුදෙව් වර්ගයා අනුගමනය කළ පිළිවෙතට සමාන ය. යුදෙව්වන් හා යක්ෂයන් අතර යම් සම්බන්ධයක් වේ දැයි අපි නො දනිමු. යක්ෂයන්ට වෙනස්ව වෛදිකයන් තම සංස්කෘතිය දඹදිව පුරා පැතිරවීමට කටයුතු කර ඇත. වෛදිකයෝ, එනම් සංස්කෘතික ආර්යයෝ, දඹදිව භාරතය බවට පත්කර මුළු රට පුරා ම වෛදික සංස්කෘතිය තහවුරුකර තම සංස්කෘතික ආධිපත්‍යය පිහිටුවූහ. යක්ෂයන් වෛදික සංස්කෘතියට මෙන් ම දඹදිවින් බිහි වූ අනෙක් සංස්කෘතීන්ට ද විරුද්ධව ක්‍රියාකර ඇති බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

මෙරට ද යක්ෂයන් තම සංස්කෘතිය පැතිරවීමට උත්සාහයක් ගෙන ඇති බවක් නො පෙනෙයි. එමෙන් ම ඔවුන් බෞද්ධයන් වීමට ද එතරම් උනන්දුවක් දක්වා නැත. මහාවංසයෙහි හා ජනප්‍රවාදයෙහි මහියංගන යක්ෂ දමනයක් ගැන කියැවෙන්නේ ඔවුන් බුදු දහමට දැක්වූ එතරම් මිත්‍රශීලී නොවූ ආකල්පය හේතුකොටගෙන ය. යක්ෂයන් බුදු දහමට දැක්වූ මේ ආකල්පය හේතුකොටගෙන සංස්කෘතික ආධිපත්‍යය පමණක් නොව දේශපාලන ආධිපත්‍යය ද ඔවුන් අතින් ගිලිහෙන්නට ඇත. එහි ප්‍රතිඵලයක් වූයේ සිංහල ඉතිහාසය, එහි සංස්කෘතික හා දේශපාලන නායකත්වය තම අතට ගත් අර්ධ වෛදිකයන් අතින් නිර්මාණය වීම ය.

දඹදිවින් පැමිණි විජය සහ පිරිස විසින් සිංහල ජාතිය බිහිවිණි යැයි කතාව ගෙතුණේ අර්ධ වෛදිකයන් එලෙස සිංහල ජාතියෙහි දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය ලබාගැනීමෙන් පසුව විය යුතු ය. සිංහල යන නමට ද සිංහ ගෝත්‍රය හා විජය රජු සම්බන්ධ කෙරෙන්නට ඇත්තේ අර්ධ වෛදිකයන් විසින් යැයි සිතාගත හැකි ය. පස්වැනි සියවස වන විට දකුණු භාරතීය ආක්‍රමණ හා ථෙරවාදයට එල්ල වූ අභියෝග හමුවේ සිංහල බෞද්ධ ඉතිහාසය  උත්තර භාරතීය නැඹුරුවක් ගෙන ඇත. සිංහල බෞද්ධ සංස්කෘතිය උත්තර භාරතයෙන් ලැබුණු එකක් බවට ඒ වන විට මතයක් ගොඩ නැගී ඇති බව පැහැදිලි ය. මෙයින් අඩුම තරමින් එක් කරුණක් පැහැදිලි ය. මහානාම හිමියන් උත්තර භාරතීය නැඹුරුවක් දැක් වී යැයි අප උපකල්පනය කළ ද, උන්වහන්සේ දක්ෂිණ භාරතයට පක්ෂපාත වී ය යන්න නම් කිසිසේත් පිළිගත නොහැක්කකි. ඒ දක්ෂිණ භාරතීය මතය අර ඇමරිකන් ඉතිහාසඥයන් මෙකල පවතින සමාජ ආකල්ප යොදාගනිමින් සිංහලයන් මහාවංසයට එරෙහි ව ගොනුකිරීමට දරණ ප්‍රයත්නයක සංරචකයක් පමණක් වෙයි. මේ ඉතිසකාරයන්ගේ වැයම මහානාම හිමියන්ගේ දක්ෂිණ භාරතීය සම්බන්ධයක් ඔස්සේ සිංහලයන් ලවා මහාවංසය ප්‍රතික්ෂේපකර ඉන්පසු සිංහලයන්ට තම ඉතිහාසය අහිමිකිරීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva